# උතුරු පළාත් සභාව - 2019 වර්ෂය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

උතුරු පළාත් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උප වගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2021 අප්‍රේල් 27 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ඔක්තෝබර් 06 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට උතුරු පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### 1.2.1 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | උතුරු පළාත් සභාව විසින් 2011 වර්ෂයේදී රු. 8,500,000කට මිල දී ගත් ගිලන් රථයක් කි.මී. 9000ක් ධාවනය කිරීමෙන් පසු අනතුරට පත් වී තිබුණි. මෙම රථය අලුත්වැඩියා කිරීම වෙනුවට, අවිධිමත් ලෙස මුලතිව් දිස්ත්‍රික් රෝහලේ ඉන්වෙන්ට්‍රි ලේඛනයෙන් කපා හැරීමට හා ජංගම නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයෙන් ඉවත් කිරීමට සමාලෝචිත වර්ෂය තුළ පියවර ගෙන තිබුණි. | පළමු මූලික විමර්ශන වාර්තාව අසම්පූර්ණය. පසුව, නැවත විමර්ශනයක් ආරම්භ කළ අතර එය අවසන් අදියරේ පවතී. | විමර්ශන කටයුතු කඩිනමින් අවසන් කර පළාත් මුදල් රීති අනුව සුදුසු පියවර ගත යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මුලතිව් අධ්‍යාපන කලාපයේ පිහිටි පාසැල් 66ක් සඳහා ගුණාත්මක යෙදවුම් වෙනුවෙන් 2019 වර්ෂයේදී ලබා දුන් රු.3,677,206ක් වැය නොකර බැංකු ගිණුම්වල රඳවා තිබුණි. | මෙම මුදලින් කොටසක් ශිෂ්‍ය ක්‍රියාකාරකම් සඳහා වැයකර ඇත. ඉතිරිය ඉගැනුම් කටයුතු සඳහා වැය කෙරේ. | ලද මුදල් අප්‍රමාදව අදාළ අරමුණු වෙනුවෙන් උපයෝජනය කළ යුතු වේ. |
| (ඇ) | උතුරු පළාත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙනුවෙන් සන්දිලිප්පායි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්ත කළ නිලධාරියා විසින් ආදායම් බලපත්‍ර ගාස්තු රු. 1,499,535ක් වංචා සහගත ලෙස ලබා ගෙන තිබුණි. | මේ සම්බන්ධයෙන් වූ මූලික විමර්ශන වාර්තාව 2021 අප්‍රේල් 08 දින උතුරු පළාත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට භාර දී තිබුණි. | විමර්ශන කටයුතු කඩිනමින් අවසන් කර නිර්දේශ ක්‍රියාත්මක කිරීම හා සුදුසු අභ්‍යන්තර පාලන පිළිවෙත් ක්‍රියාත්මක කළ යුතු වේ. |

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදි. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, උතුරු පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මත සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් තොර බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තව ද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිත උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය සැලකිල්ලට ගන්නා නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම,

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත්ව ඇත.

(අ) 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 නීති, රීති හා රෙගුලාසි අනුකූල නොවීම්

නියැදි විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ V පරිච්ඡේදයේ 7:1 වගන්තිය | උතුරු පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ සහ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ රාජකාරියට වාර්තා නොකළ නිලධාරීන් 08 දෙනෙකුගේ සේවය අවසන් නොකර මාස 03ත් වර්ෂ 6ත් අතර කාලයක් ප්‍රමාද කර තිබුණි. | මෙම නිලධාරීන්ගේ සේවය අවසන් කිරීමේ ලිපි කඩිනමින් නිකුත් කරන ලෙසට අදාළ දෙපාර්තමේන්තු වෙත උපදෙස් ලබා දී ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැය විෂයයන් 16ක ප්‍රතිපාදනවලින් සියයට 36ක් ඉතිරි වී තිබුණු අතර වැය විෂයයන් 09ක පැවැති රු. 491,148,908ක ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන් වෙත මාරු කර තිබුණි. එමෙන්ම, වැය විෂයයන් 12ක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන සලසා තිබුණ ද, ඉන් 12,918,500ක් වෙනත් වැය විෂයයන් වෙත මාරු කර තිබුණි. මාරු කළ එම ප්‍රතිපාදන ද සම්පූර්ණයෙන්ම වැය කර නොතිබුණි. | මහා භාණ්ඩාගාරයෙන් අග්‍රිම නොලැබීම නිසා ප්‍රතිපාදන ඉතිරිවීම් ඇති වූ අතර අපේක්ෂිත ආදායම් නොලැබීම නිසා අදාළ වියදම් සිදු කළ නොහැකි විය. | අනුමත ප්‍රතිපාදන, අදාළ අරමුණු වෙනුවෙන් උපයෝජනය කළ යුතු වේ. |
| (ආ) | සභා ලේකම් කාර්යාලය හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් පොකුර (Cluster) වෙත ලද පුනරාවර්තන ප්‍රතිපාදනවලින් පිළිවෙලින් සියයට 75ක් හා සියයට 51ක් ඉතිරි වී තිබුණි. | පළාත් සභාව ක්‍රියාත්මක නොවීමත්, මධ්‍යම රජයේ ලැබීම් අපේක්ෂා කළ පරිදි නොලැබීමත් නිසා ප්‍රතිපාදන ඉතිරි විය. | අනුමත ප්‍රතිපාදන අදාළ කාර්යයන්වලට උපයෝජනය කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී උතුරු පළාත් සභාවේ මූලධන හා පුනරාවර්තන ප්‍රතිපාදන ඉතිරි වීම් පිළිවෙලින් රු. මිලියන 1,901ක් හා රු.මිලියන 919ක් විය. | මූලධන වියදම් සඳහා අක් මුදල් ප්‍රමාණවත් පරිදි නොලැබීම, යම් යම් ව්‍යාපෘති සඳහා වියදම් නොතිබීම හා වියදම් සඳහා උපදෙස් නොලැබීම යනාදී කාරණා මත මූලධන වියදම් ඉතිරි වී තිබුණි. එමෙන්ම, මධ්‍යම රජයෙන් ලැබිය යුතු ආදායම් නොලැබීම හා චක්‍රලේඛ විධිවිධාන මගින් වියදම් පාලනය කිරීම නිසා පුනරාවර්තන ප්‍රතිපාදනවල ඉතිරිවීම් ඇති වී තිබුණි. | ප්‍රතිපාදනය උපයෝජනය කිරීමට ප්‍රමාණවත් පියවර ගත යුතුවේ. |

## 2.2 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ රු.8,040,486,055 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.8,213,740,548 ක් විය.

## 3 ප්‍රඥප්ති ගිණුම්/ අරමුදල් ගිණුම්/ වාණිජ අත්තිකාරම් ගිණුම් හා අනෙකුත් අත්තිකාරම් ගිණුම්

## 3.1 අනෙකුත් අත්තිකාරම් ගිණුම් ගිණුම්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සේවය අවසන් කළ දෙදෙනෙකුගෙන් රු. 245,094ක් හා මියගිය නිලධාරියෙකුගෙන් රු. 153,967ක් අයකර ගැනීමට ඵලදායී පියවර ගෙන නොතිබුණි. | සේවය අවසන් කළ එක් නිලධාරියෙකුගේ ඇපකරුගෙන් ණය අය කරන අතර අනෙක් නිලධාරියා නැවත සේවයේ පිහිටුවීමෙන් පසු ණය අයකර ගැනීමට පියවර ගෙන ඇත. මියගිය නිලධාරියාගේ ශේෂය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් පියවා ගැනීමට කටයුතු කෙරේ. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට අප්‍රමාදව කටයුතු කිරීම. |

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුලතිව් අධ්‍යාපන කළාපයේ පාසල් 03ක් තාවකාලික මඩුවල පවත්වා ගෙන යනු ලබයි. | එක් පාසැලක් ඉදි කිරිම සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණු අතර අනෙක් පාසැල් 02ක සඳහා PSDG වැඩසටහන යටතේ ගොඩනැගිලි ඉදි කිරීමට යෝජනා ඉදිරිපත් කර තිබුණි. | ප්‍රමුඛතාවය දිය යුතු කරුණක් සේ සලකා ගොඩනැගිලි 03 ක් ඉදිකර දිය යුතුය. |
| (ආ) | කරච්චි ප්‍රාදේශීය සභාව විසින් සංවර්ධන කාර්යයන් සඳහා යෙදවිය යුතු මුදල්, බැංකු ජංගම ගිණුම්වල නිෂ්කාර්යව රඳවා තිබුණි. එලෙස රඳවා තිබුණු ගිණුම්වල මාසික ශේෂය රු. මිලියන 49ත් රු. මිලියන 93ත් අතර පරාසයක විය. | ජංගම ගිණුම්වල පැවැති මුදල් 2019 වර්ෂයේදී ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර ඇත. | අතිරික්ත අරමුදල් ප්‍රාදේශීය සභා පනතේ දැක්වෙන අරමුණු සාක්ෂාත්කර ගැනීම සඳහා උපයෝජනය කළ යුතුය. |

### 4.2 මතභේදාත්මක ස්වරූපයේ ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වට්ටකච්චි ආයුර්වේද රෝහල් ගොඩනැගිල්ලක් ඉදි කිරීමේදී සාවද්‍ය මිනුම් මත රු. 718,395ක් කරච්චි ප්‍රාදේශීය සභාව විසින් ගෙවා තිබුණි. | පළාත් පාලන කොමසාරිස්වරයා විසින් පත් කළ විමර්ශන කමිටුවේ වාර්තාව ලද පසු පියවර ගැනේ. | වැඩිපුර කළ ගෙවීම් අප්‍රමාදව අයකරගත යුතුය. |
| (ආ) | එකතු කළ අගය මත බදු සම්බන්ධයෙන් සක්‍රීය බැඳියාවක් නොමැති කොන්ත්‍රාත්කරුවන් වෙත යාපනය කලාප අධ්‍යාපන කාර්යාලය විසින් එකතු කළ අගය මත බදු රු. 654,995ක් ගෙවා තිබීම වෙනුවෙන් වර්ෂ 2½ක කාලය තුළ කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් විගණනයක් සිදුකර ඒ අනුව කටයුතු කරන බව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් දන්වා එවා තිබුණි. | අදාළ බදු ගෙවීමට පෙර ඒ සඳහා කොන්ත්‍රාත්කරුවන් විධිමත්ව ලියාපදිංචි වී සිටී ද යන්න තහවුරු කරගත යුතු අතර දෝෂ සහගත ගෙවීම් අය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මුසලි පශු සම්පත් සමුපාකාර සමිතිය විසින් එකතුව රු. 2,524,750ක් වූ චෙක්පත් 03ක් මාන්තායි බටහිර පශු වෛද්‍ය අධිකාරීවරයා සතු පෞද්ගලික බැංකු ගිණුම් 03ක තැන්පත් කර තිබුණි. එමෙන්ම, මුරුන්ගන් රජයේ පශු සම්පත් රෝහලේ සේවකයින් තිදෙනෙකු හා ප්‍රතිලාභීන් 07 දෙනෙකු වෙත නිකුත් කළ රු.11,150,000ක චෙක්පත්ද, එම වෛද්‍යවරයා විසින් මුදල් කරගෙන තිබුණි. | අදාළ සැලැසුම ක්‍රියාත්මක කිරීම සඳහා මාන්තායි බටහිර පශු සම්පත් වෛද්‍ය අධිකාරීවරයා වශයෙන් සහයෝගය ලබා දීම හැර මූල්‍ය ප්‍රතිපාදන වැය කිරීම සම්බන්ධ කාරණා පශු සම්පත් වෛද්‍ය අධිකාරී කාර්යාලය විසින් ක්‍රියාත්මක කර නොතිබුණි. | මෙම අයථා මුදල් පරිහරණය සම්බන්ධයෙන් විමර්ශනයක් කළ යුතුය. |
| (ඈ) | යා/සිදම්බරා විද්‍යාලයේ පැසි පන්දු පිට්ටනියේ සිදු කළ ඉදි කිරීම්වල දී රු. 112,527ක් වැඩිපුර ගෙවීමට වඩමාරච්චි කලාප අධ්‍යාපන කාර්යාලය පියවර ගෙන තිබුණි. | පාසැලේ පැවති නොසන්සුන්කාරී තත්ත්වය හේතුවෙන් ඉදි කිරීම් කටයුතු අතරමැද නවතා දැමීමට සිදු විය. ඉදිකළ පැසි පන්දු කොන්ක්‍රීට් කණු පවා හානියට පත්කර තිබුණි. බිල්පත් සකස්කර පාසැල් වැඩ අධීක්ෂකගේ තහවුරු කිරීමට අනුකූලව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් කාර්යය අවසන් බවට තහවුරු කරගෙන රු. 285,000ක් ගෙවා තිබුණි. | සත්‍ය වශයෙන්ම ඉටුකළ වැඩවලට පමණක් ගෙවීම් කිරීම හා දෝෂ සහගත ගෙවීම් අය කළ යුතුය. |
| (ඉ) | මුරුන්ගන් රජයේ පශු වෛද්‍ය අධිකාරීවරයා විසින් ජීවනෝපාය ආධාර වැඩසටහන වෙනුවෙන් මාසයක් වයසැති කිකිළියන් 4500ක් 2016 ජූලි 05 දිනැති හා NP/26/02/CSR/2016/02 දරන චක්‍රලේඛයේ උපදෙස්වලට පටහැනිව වැඩි මිලකට මිල දී ගැනීම නිසා රු. 427,500ක වැඩිපුර ගෙවීමක් සිදු වී තිබුණි. | පළාත් පශු සම්පත් නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂගේ අංක NP/26/02/01/PSDG හා 2016 මාර්තු 04 දිනැතිව නිකුත් කළ මිල නියම කිරීමේ ලිපිය අනුව, පැටවීම් හා ගොඩබෑම් ඇතුළත්ව කිකිළියකගේ මිල රු. 300ක් ලෙස මිල තීරණය කර තිබුණි. | චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව කටයුතු කිරීම පිළිබඳව විමර්ශනයක් සිදුකර වැඩිපුර ගෙවූ මුදල් අයකරගත යුතුය. |
| (ඊ) | මධ්‍යම රජයේ ජීවනෝපාය ආධාර වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා මුරුන්ගන් හා නානාට්ටාන් රජයේ පශු වෛද්‍යවරුන්ගේ පෞද්ගලික බැංකු ගිණුම් වෙත පිළිවෙලින් රු. 4,025,000ක් හා රු. 2,638,050ක චෙක්පත් බැරකර තිබුණි. | නානාට්ටාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2016 ජූනි 30 දින ගනු ලැබූ තීරණය මත රජයේ පශු වෛද්‍යවරුන් කටයුතු කර තිබුණි. ගවයින් පිළිබඳ තාක්ෂණික ඇගයීම හා ගව සැපයුම්කරුට ගෙවන මුදලට වගකිව යුතු අය ලෙසට පමණක් රජයේ පශු වෛද්‍යවරුන් ක්‍රියාකර තිබුණු බවට මූලික විමර්ශන කමිටුව විසින් තහවුරු කර තිබේ. | මෙලෙස මුදල් පරිහරණය කිරීම පිළිබඳ විධිමත් විමර්ශනයක් කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (උ) | මාන්තායි බටහිර ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය උදෙසා රු. 2,534,750කට මිල දී ගත් කිරි දෙනුන් වෙනුවෙන් අදාළ සැපයුම්කරුට ගෙවීම් කිරීම වෙනුවට අදාළ රජයේ පශු වෛද්‍ය අධිකාරීවරයාගේ පෞද්ගලික බැංකු ගිණුමට එම මුදල් බැර කර තිබුණි. | මේ සම්බන්ධයෙන් උතුරු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් විමර්ශනයක් සිදු කෙරෙමින් පවතී. | විමර්ශන නිර්දේශ කඩිනමින් ලබා ගෙන අවශ්‍ය පියවරගත යුතුය. |
| (ඌ) | පළාත් ජලසම්පාදන දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කර 2019 අප්‍රේල් මාසයේදී රු. 4,041,004කට වෙන්දේසි කළ තොණ්ඩමනාරු ලවන ජල බාධකයේ පැරණි ලෝහමය ගේට්ටු ගැනුම්කරු විසින් ගිවිසුම් කොන්දේසි පරිදි පැය 24කින් ඉවත් කර ගැනීම වෙනුවට මාසයක කාල ප්‍රමාදයකින් පසුව ඒවා ඉවත් කරගෙන තිබුණි. ඊට පසු එම ගැනුම්කරු වෙත ඉහත අයකළ මුදලින් සියයට 55ක් ආපසු ගෙවීමට පළාත් අධ්‍යක්ෂවරයා කටයුතු කිරීම නිසා රු. 2,211,335ක මූල්‍යමය හානියක් රජයට සිදු වී තිබුණි. | මෙම ගේට්ටු මැන එහි වටිනාකම ගණනය කිරීමට වැය වන මුදල ඉතාමත් අධික වන බැවින් දළ තක්සේරුවක් සිදුකර අදාළ වෙන්දේසිය කැඳවිය. පසුව ඒවා ඉවත් කිරීමේදී එම ලංසුකරුවන් විසින් සිදුකළ ඇගයීමේදී එම පැරණි යකඩවල සත්‍ය වටිනාකම තක්සේරු කරගත හැකි විය. මේ නිසා එම යකඩවල වටිනාකම අඩු අගයක් ගැනීම නිසා රු. 2,211,335ක් අඩු වීම හැර වෙන්දේසියේ විකිණීමෙන් කිසිදු ආදායම් අහිමි වීමක් සිදු වී නොතිබුණි. | වෙන්දේසි භාණ්ඩ සඳහා නිවැරදි තක්සේරුවක් සිදු නොකිරීම, ඉවත් කර නොගත් භාණ්ඩ සඳහා ගිවිසුම් කොන්දේසි පරිදි කටයුතු නොකිරීම, වෙන්දේසි මගින් විකුණුම් ලෙස අයකළ මුදලින් ආපසු ගැණුම්කරුට මුදල් ගෙවීම යනාදී දෑ පිළිබඳ විධිමත් විමර්ශනයක් සිදු කළ යුතුය. |

**4.3 හඳුනාගත් පාඩු**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මන්නාරම දිස්ත්‍රික් රෝහලේ පැවැති රු. 2,547,786ක ඖෂධ කල් ඉකුත් වී තිබුණි. උතුරු පළාත තුළ එක් රෝහළක අතිරික්තව පවතින ඖෂධ, වෙනත් රෝහල්වලට බෙදාහැරීමට ක්‍රමවේදයක් නොතිබීම මෙයට හේතු වී තිබුණි. | මෙම කල් ඉකුත් වූ තොග සම්බන්ධයෙන් විමර්ශන කමිටුවක් ස්ථාපිත කර පාඩු කපා හැරීමට පියවර ගනිමින් සිටී. | ඖෂධ තොග ප්‍රසස්ත මට්ටමින් පවත්වා ගැනීමට පිළිවෙත් සකස් කළ යුතුය. |

## 4.4 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

### 4.4.1 ප්‍රමාද වූ ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| උතුරු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කළ රු. මිලියන 179.65ක ගොඩනැගිලි ඉදි කිරීම් හා ප්‍රතිසංස්කරණ කාර්යයන් 19ක් ගිවිසුම් කොන්දේසිවල සඳහන් දිනවල දී ආරම්භ නොකර දින 30ත් දින 155ත් අතර කාල ප්‍රමාදයකින් පසුව ආරම්භ කර තිබුණි. | තක්සේරු කිරීම, තාක්ෂණික ඇගයීම, කොන්ත්‍රාත් ලියවිලි සකස් කිරීම, සැලැසුම් නිර්මාණය ආදී දැ සම්බන්ධයෙන් සිදු වූ ප්‍රමාද වීම් නිසා සැලැසුම් කළ පරිදි කාර්යයන් ආරම්භ කළ නොහැකි විය. | ගිවිසුම් කොන්දේසි කඩ කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීම. |

### 4.4.2 ක්‍රියාත්මක නොකළ ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ළඟම පාසැල හොඳම පාසැල වැඩසටහන යටතේ උතුරු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කළ එකතුව රු. මිලියන 44.73ක් වූ ගොඩනැගිලි 05ක ඉදි කිරීම් ආරම්භ කර නොතිබුණි. | ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා ඉඩකඩ ප්‍රමාණවත් නොවීම, වෙනත් පාසැල්වල පන්ති කාමර ඉදිකිරීමේ අවශ්‍යතා පැවැතීම ආදිය මත මෙම ව්‍යාපෘතිය ඉටුකර නොතිබුණි. | අවශ්‍යතාව නිවැරදිව හඳුනාගෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුය. |

## 4.5 අරමුණුවලට පටහැනි ක්‍රියාකාරකම්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| උතුරු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛවලට පටහැනිව කලාප අධ්‍යාපන කාර්යාල විසින් අයකළ රු. 12,519,303ක ශිෂ්‍ය වාර පරීක්ෂණ ගාස්තු බැංකු ගිණුම්වල නිෂ්කාර්යව පැවැතිණි. එම මුදල් කිසිවක් පළාත් ආදායමට බැර කර නොතිබුණු අතර ශිෂ්‍ය සුභසාධනය වෙනුවෙන් හෝ වැයකර නොතිබුණි. | 2020 මාර්තු මාසයේ සිට පාසැල් විධිමත්ව ක්‍රියාත්මක නොවූ බැවින් වාර පරීක්ෂණ හා ආදර්ශ පරීක්ෂණ නොපැවැත්විණි. මේ නිසා 2021 වර්ෂයේ සිට පවත්වන විභාග සඳහා ශිෂ්‍යන්ගෙන් ගාස්තු අය නොකර ඉදිරිව පවතින මුදල් උපයෝජනය කිරීමට නියමිත ය. | මුදල් නිෂ්කාර්යව නොතැබිය යුතුය. |

**4.6 වත්කම් කළමනාකරණය**

**4.6.1 නඩත්තුව හා අළුත්වැඩියා කටයුතු සිදු නොකිරීම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නිසි පරිදි නඩත්තු නොකිරීම හේතුවෙන් පළාත් සභා මණ්ඩපයේ වූ දැවමය භාණ්ඩ වේයන් විසින් විනාශ කිරීම නිසා ඒවා අලුත්වැඩියාව වෙනුවෙන් රු. මිලියන 7.1ක් වැය කර තිබුණි. | සවිකර තිබූ මේස වේයන් විසින් විනාශ කර තිබුණු බව නිරීක්ෂණය විය. එහෙත්, අලුත්වැඩියාව සඳහා වැය කළ මුදලින් වැඩි කොටසක් සභා මණ්ඩපය නවීකරණය කිරීමට, ස්වයංක්‍රීය වීඩියෝ පද්ධතියක් සවි කිරීමට සහ ලී බඩුවල පිහිටීම වෙනස් කිරීම සඳහා විය. | වත්කම්වල ආරක්ෂාව තහවුරු කළ යුතුය. |

**4.7 කාර්ය මණ්ඩල පරිපාලනය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එකතුව 40468ක් වූ උතුරු පළාත් සභාවේ අනුමත කාර්ය මණ්ඩලයෙන් පුරප්පාඩු 6336ක් පැවැතිණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක 02/2020 දරන 2020 ඔක්තෝබර් 26 දිනැති චක්‍රලේඛය ක්‍රියාත්මක වූ දින සිට පුරප්පාඩු 1463ක් සම්පූර්ණ කිරීම සඳහා අනුමැතිය ලැබී ඉන් පුරපුපාඩු 272ක් සම්පූර්ණ කර තිබුණි. | පුරප්පාඩු පිරවීමට හෝ අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනයට පියවර ගත යුතුය. |
| (ආ) | උතුරු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලවල පුරප්පාඩු පිළිවෙලින් 1535ක් හා 444ක් වූ අතර අතිරික්තතා 13 ක් ද පැවැතිණි. | ගරු ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය මත යම් පුරප්පාඩු පියවා ඇති අතර අනෙකුත් පුරප්පාඩු සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අවශ්‍ය අනුමැතිය ලැබී නොතිබුණි. අතිරික්ත සේවක සංඛ්‍යාව සම්බන්ධයෙන් ක්‍රියා මාර්ග ගෙන ඇත. | අවශ්‍යතාව පරිදි පුරප්පාඩු සම්පූර්ණ කිරීමටත්, අතිරික්ත නිලධාරීන් ඵලදායී ලෙස අනුයුක්ත කිරීමටත් කටයුතු කළ යුතු වේ. |